# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/1 - 2017 ජුනි මස 19 වැනි සඳුදා - 2017.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්ති යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් එකී පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.11.10 වැනි දිනැති අංක 1992/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනය II පහත උපලේඛනය පරිදි සංශෝධනය කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 ජුනි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

2016.11.10 දිනැති අංක 1992/29 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ උපලේඛනය II හි අයිතම අංක 1(ඉ)ට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්,

| *අංකය* *I* | *විස්තරය* *II* | | *නිෂ්පාදන බද්ද* *III* |
|---|---|---|---|
| 1 | (ඊ) | දේශීයව නිෂ්පාදනය කළ මෝටර් රථයක් මිලදී ගනු ලබන හෝ මෝටර් රථයක් ආනයනය කරනු ලබන<br><br>පළමුවන උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු විසින් 2017.04.21 දිනැති 2017/01 දරන පළාත් පාලන සහ පළාත් සභා චක්‍රලේඛයට අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් 35% |

07-70


1A - PG 3577 — 557 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
සැ. යු.- *අති විශෙෂ ගැසට්* අංක 2023/1 කාණ්ඩය 2023/67න් අවසන් වේ.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*